# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2360/26 – 2023 නොවැම්බර් මස 28 වැනි අඟහරුවාදා – 2023.11.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) සහ 154 (ඊ) ව්‍යවස්ථාවන් මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මා විසින්, ඌව පළාතේ පළාත් සභාවේ 2000 අංක 05 දරන ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩල ප්‍රඥප්තියේ 6අ(1) වගන්තිය අනුව, පහත සඳහන් පත්කිරීම සිදුකර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| *නම හා ලිපිනය* | *තනතුර* | *කාල සීමාව* |
|---|---|---|
| ජී. ආර්. විමලදාස මහතා,<br>'' දිමුතු''<br>ජනපදය,<br>හම්බේගමුව. | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති | 2023.08.12 වන දින සිට මා විසින් ධුරයෙන් ඉවත්කරනු නොලැබුවහොත් හැර පත්වීම 2024.03.14 වන දින දක්වා පමණක් වලංගු වේ. |

ඒ. ජේ. එම්. මුසම්මිල්,
ආණ්ඩුකාරවර,
ඌව පළාත.

2023 නොවැම්බර් මස 24 වැනි දින,
රජවීදිය,
බදුල්ල,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 11- 0321/1

## ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) සහ 154 (ඊ) ව්‍යවස්ථාවන් මගින් ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාතේ පළාත් සභාවේ 2001 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ 6(ඉ) වගන්තිය අනුව, පහත සඳහන් පත්කිරීම සිදුකර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| *නම හා ලිපිනය* | *තනතුර* | *කාලසීමාව* |
|---|---|---|
| ආර්. එම්. සුරංග සම්පත් රාජපක්ෂ මහතා,<br>අංක 10/6,<br>ජාතික නිවාස,<br>වීරියපුර,<br>බදුල්ල. | ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2023.09.25 වන දින සිට මා 2026.02.12 වන දින දක්වා හෝ මාගේ කැමැත්ත පරිදි මා විසින් එම පත්වීම අවසන් කරන දිනය හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් වලංගු වේ. |

**ඒ. ජේ. එම්. මුසම්මිල්,**
ආණ්ඩුකාරවර,
ඌව පළාත.

2023 නොවැම්බර් මස 24 වැනි දින,
රජවීදිය,
බදුල්ල,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 11- 0321/2

---

## ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) උපවගන්තිය යටතේ ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියේ නිලධාරිනී එච්. එම්. එච්. උදයංගනී මහත්මිය, 2023.07.04 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව බදුල්ල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

02. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරිනී කේ. අයි. අනුෂා මහත්මිය, වහාම ක්‍රියාත්මක වන පරිදි (2023.07.10 වන දින සිට) ඌව පළාත් ඉඩම් කොමසාරිස් තනතුරේ පූර්ණකාලීන වැඩ බැලීමට,

03. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරිනී එච්. කේ. ඒ. බී. එස්. කොඩිතුවක්කු මෙනවිය, වහාම ක්‍රියාත්මක වන පරිදි (2023.07.10 වන දින සිට), ඌව පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ වශයෙන්,

04. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී ගාමිණි මහින්දපාල ජෝපියස් මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2023.08.03 වන දින සිට), ඌව පළාත් මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්,

05. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරී ජේ. එම්. සේනාධීර මහතා, තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව වහාම ක්‍රියාත්මක වන පරිදි, (2023.07.27 වන දින සිට) මහියංගණ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට,

06. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරී ඩී. එම්. එන්. දිසානායක මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2023.08.03 දින සිට), ඌව පළාත් සභා සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් වශයෙන්,

07. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී එච්. එම්. නන්දසේන මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2023.08.03 දින සිට), ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්,

08. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරී ඊ. ජී. ජේ. පී. ආරියරත්න මහතා, තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අමතරව 2023.08.11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, බදුල්ල සහකාර පළාත් පාලන කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට,

09. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරී එච්. පී. ඒ. ජී. අනුරුද්ධ මහතා, 2022.09.20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වශයෙන්,

10. ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ I ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරී පී. ජී. ජේ. ගමගේ මහතා, 2023.10.02 වන දින සිට ඌව පළාත් ආදායම් කොමසාරිස් තනතුරට නිත්‍ය නිලධාරියෙක් පත්කරන තෙක් හෝ මාගේ කැමැත්ත පරිදි ම විසින් මෙම පත්වීම අවසන් කරන දිනය හෝ 2024.10.01 යන දින වලින් කලින් එළඹෙන දිනය දක්වා පමණක් කොන්ත්‍රාත් පදනම මත ඌව පළාත් ආදායම් කොමසාරිස් වශයෙන් නැවත සේවයේ යෙදවීමට,

11. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී ජේ. එම්. යූ. කේ. ජයසේකර මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2023.10.09 වන දින සිට), ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්,

12. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී ඩබ්. එම්. ආර්. රංජිත් මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2023.10.09 වන දින සිට), තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) තනතුරේ වැඩ බැලීමට.

13. මොණරාගල නියොජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ එස්. එම්. එස්. උදයංගනී මහත්මිය, 2023.10.07 වන දින සිට 2023.10.22 වන දින දක්වා විදේශගත වන බැවින්, 2023.10.07 වන දින සිට ඒ මහත්මිය නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියේ නිලධාරිණී ආර්. පී. වාසනා ප්‍රසංගී මහත්මිය තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව මොණරාගල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

14. ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ එච්. කේ. පී. ජයලත් මහතා, 2023.10.07 වන දින 2023.10.22 දින දක්වා විදේශගත වන බැවින් 2023.10.07 වන දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියේ නිලධාරිනි එස්. සී. සෙල්ලහේවා මහත්මිය තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව, ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කිරීමට.

15. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරී ඩබ්ලිව්. රන්දෙණිය මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2023.11.06 වන දින සිට), ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම් තනතුරේ වැඩ බැලීමට.

16. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරී ජේ. එම්. සේනාධීර මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2023.11.06 වන දින සිට), තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව මහියංගණ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

17. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරී එම්. එම්. විජේනායක මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2023.11.08 වන දින සිට), ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) තනතුරේ පූර්ණකාලීනව වැඩ බැලීමට.

18. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරී, එච්. එම්. බී. කරුණාදාස මහතා, 2023.10.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව, තණමල්විල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

19. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරී, එම්. එම්. විජේනායක මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2023.11.08 වන දින සිට), තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව, ඌව පළාත් සභාවේ සභා ලේකම් තනතුරේ වැඩ බැලීමට.

20. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරී කේ. බී. ඒ. එම්. එස්. අබේකෝන් මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2023.11.09 වන දින සිට), ඌව පළාත් සභාවේ සභා ලේකම් වශයෙන්,

21. ඌව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය එස්. කේ. වීරසුන්දර මහතා, 2023.11.27 වන දින සිට 2023.12.01 වන දින දක්වා විදේශගතවන බැවින්, 2023.11.27 වන දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරී, වෛද්‍ය එම්. ජී. සනත් මහතා තම නිත්‍ය තනතුරේ රාජකාරීවලට අමතරව, ඌව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

**ඒ. ජේ. එම්. මුසම්මිල්,**
ආණ්ඩුකාරවර,
ඌව පළාත්.

2023 නොවැම්බර් මස 24 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 11- 0321/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.